තෙල් කුයිල

(ඉන්දියානු ලේඛිකා අමිරිතා ප්‍රීතම් විසින් රචිත " Stench of Kerosine" නම් කෙටි කතාවෙ හි සාරාංශය කි")

අමිරිතා ප්‍රීතම් 1919 දී ඉන්දියාවේ ගුජ්රන්වාලා හිදී උපත ලැබුවාය. ඇය වත්මන් ඉන්දීය සමාජය තුළ ඉතා සුප්‍රකට පන්ජාබි ලේඛිකාවකි. කිවිඳියකි. කුසලතා පූර්ණ නිර්මාණ සඳහා ඇය කිහිපවරක්ම සම්මානයට පාත්‍ර වූවාය. ඉන්දියාව දෙකඩ වූ වකවානුවෙහි මිනිසුන් අත්විඳි සියළු දුක්ඛ දෝමනස්සයන් ද, විඳි අපමණ හිරිහැරද ඇගේ නිර්මාණකරණයේ ආත්මය විය. හුදෙකලාවෙන් පීඩිත මිනිස් හදවත් වල රාවය ඕ නොපැකිළව ඇගේ නිර්මාණ හරහා ලොවට හෙළිකලාය. ඇය මිය යන විට නවකතා 14 ක්ද, කෙටිකතා සංග්‍රහ 15 ක්ද , ගද්‍ය රචනා වෙළුම් 23 ක්ද ප්‍රකාශයට පත් කොට තිබිණ. "පින්ජර්", "ඒක් හී සාරා", "කහානියොන්කි ආන්ගන් මේ", "උන්වාස් දින්", "අදාලත්" වැනි නව කතාද, "සෆර්", "පන්ජාබි කවිතාවලි", "ආවාස්" වැනි ජනප්‍රිය කාව්‍ය සංග්‍රහයන්ද, "ලාල් ඩාගේ කා රිත්තා", "යේ කහානියා ජෝ කහානියා නහි සෙ", "වීරාගෝ කී රාත්" වැනි කෙටි කතා සංග්‍රහද ඒ අතර වේ.

අමිරිතා ප්‍රීතම්

ප්‍රශංසනී පරණවිතාන
prashansanip@yahoo.com

පිටතින් ඇසුණේ වෙළඹිකගෙ හේමාරවයකි. ගුලරි එය හැඳින ගත්තාය. වෙළඹ එවා තිබුණේ ගුලරි ගේ දෙමාපියන් විසිනි. වහ වහා පිටතට දිව ආ ඕ වෙළඹගේ ගෙල මතින් සිය හිස තබා ගත්තී, දෙමාපියන් වෙත යාමට විවර වූ ද්වාරය එය බැව් හොඳින් දැන සිටි බැවිනි.

ඇගේ සැමියාගේ ගම පිහිටා තිබුණේ උස් තැනි බිමෙකය. ඉන් පහළට දිවෙන මාවත් වඩාත් වංගු සහිත වූ අතර කඳු පාමුල තෙක් දැඩි බෑවුම් සහිතව ප්‍රපාතාකාරයෙන් විහිදී තිබිණි. එහි සිට මයිල කිහිපයක් ඔබ්බෙන් වූ චම්බාවෙහි ගුලරිගේ දෙමාපියෝ විසූහ. කඳු මුදුනේ සිට බලන්නෙකුට ඇතින් පිහිටි චම්බාව එක එල්ලේ බලාගත හැකිය. ගුලරි මාපියන් පිළිබඳ සාංකාවෙන් පසුවන හැම මොහොතකම මානක් ද කැටුව කඳු මුදුනට එන්නට පුරුදුව සිටියාය. එවිට සූර්ය රශ්මි කදම්භයෙන් තැඟෑවී දිදුලන චම්බාව දකින ඕ හද පුරා මැවෙන භක්ත්‍යාදරයෙන් කුල්මත් වූවාය.

සෑම වසරකටම වරක් පාහේ අස්වනු නෙළන සමයේ දී, සිය දෙමාපියන් වෙත යාමටත් ඔවුන් හා දින කිහිපයක් එක්ව ගත කිරීමටත් ගුලරි වරම් ලද්දීය. ගුලරි කැඳවාගෙන එනු පිණිස කෙනෙකු චම්බාවෙහි සිට ලක්මන්දාවට යැවීම ඇගේ මාපියෝ සිරිතක් කොට ගෙන සිටියහ. එකල විවාහ වී පිටගම ගොස් සිටි ඇගේ මිතුරියෝ ද අස්වනු මංගල්‍ය සඳහා සිය ගම පියස වෙත ආහ. වාර්ෂික මිතුරු හමුව දුක් සුසුම් හා ප්‍රීතිය රැගත් සිදුවීම් වලින් පිරිහිරි යන්නට මග බලමින් හුන්නේය. ඔවුහු එක්ව ගමන් බිමන් ගියහ. ලඟ ලඟම එන අස්වනු මංගල්‍යය සඳහා අලුත් ඇඳුම් සූදානම් කලහ. උපට්ටාවන් ට සායම පෙවීම, කැඳ දැමීම සහ දිස්නය සඳහා තලාතු මිනිරන් ඉසීම කළහ. විදුරු වළලුත් රිදී කරාබුත් මිල දී ගත්හ.

අස්වනු මංගල්‍යය උදාවන තෙක් ගුලරි ඇඟිලි ගනිමින් හුන්නාය. මෙතෙක් කල් ගුවන සිසාරා පැතිරී හුන් මෝසම් වළාකුළු සියල්ල සරත් සුළඟ විසින් පලවා හැර පැහැදිලි අහසක් මතු කරදිදී ගුලරිට ඒ පිළිබඳ හිතන්නට තිබූ කාලය මඳ විය. ඕ ගවයන්ට තණ කැවීම් කළාය. ගෙදර දොර කටයුතු කළාය. නැන්දා මාමා වෙනුවෙන් අහර පිලියෙල කලාය. ගමෙන් කෙනෙකු ඈ කැටුව යන්නට එන්නට පෙර සියල්ල කඩිනමින් අහවර කොට නොඉවසිල්ලෙන් බලා හුන්නාය.

දැන් යළිත් වරක් එම මොහොත උදාවී ඇත. ඕ උතුරායන ප්‍රමෝදයෙන් යුතුව වෙළඹ සුරතල් කළාය. ගුලරි කැඳවා ගෙන යාමට පැමිණි මෙහෙකරුවා වූ නාතුට අචාර කළ ගුලරි එළඹෙන දින යෙදී ඇති ගමනට ලහි ලහියේ සූදානම් වූවාය. ඒ පිළිබඳ ගුලරි තුල වූ පුමෙෝධය වචනයෙන් කීමට ඇට අවැසි නොවූයේ ඇගේ මුහුණ ඈ තුල හද තුල වූ සියළු හැඟුම් වල කැඩපතක් බඳු වූ බැවිනි. මානක් හුකාවෙන් දුම් උගුරක් ඇද මොහොතකට දෙනෙත පියා ගත්තේය. ඒ දුම්කොල වලින් නැගුණු අප්‍රසන්න බවෙන් හෝ ගුලරිට මුහුණ දීමට ඔහු තුල වූ අපහසුතාවයෙන් විය හැකිය.

"ඔයා සැණකෙළියට එනව නේද....එක දවසකට හරි?" ගුලරි බැගෑපත් වූවාය.

පිලිතුරු නොදුන් මානක් උරමින් සිටි මැටි පයිප්පය පසෙකින් තැබුවේය.

" ඇයි කතා කරන්නෙ නැත්තෙ?" ගුලරි නෝක්කාඩුවෙන් ඇසුවාය. "මම ඔයාට දෙයක් කියන්නද?"

"මම දන්නව ඔයා මොකද්ද කියන්න යන්නෙ කියල - අම්ම තාත්ත බලන්න යන්නෙ අවුරුද්දටම එක සැරයයි කියලනේ...මීට කලින් කවදාවත් මම ඔයාව නවත්තල තියෙනවද ගුලරි?"

"එහෙනම්, මේ වතාවෙ මාව නවත්තන්න ඔයාට තියෙන වුවමනාව මොකද්ද?" ගුලරි පෙරලා ඇසුවාය.

" මේකයි....." මානක් වචන ගිල ගත්තේය.

" ඔයාගේ අම්මගෙ අකමැත්තක් නැත්නම් ඔයා එපා කියන්නෙ ඇයි?" ඕ ළදැරියක සේ මුරණ්ඩු වූවාය.

"ගුලරි යන්නෙපා...මම ආයෙත් කියන්නෙ මේ වතාවෙ විතරක් නොගිහින් ඉන්න බැරිද?" බට නළාව ගුලරි අත තබමින් මානක් කියා සිටියේය. ඉන් එහා යමක් කීමට ඔහුට නොහැකි විණි. මුව ගොළු වී වචන පැටලිණි.

"ඒත් ඇයි?" ඕ පෙරලා ඇසුවාය. "සැණකෙළිය දවසට එන්න, අපිට ආපහු එකටම එන්න පුළුවන්, මම පොරොන්දු වෙනවා"

මානක් කිසිවක් නොදෙඩුවේය.

ඔවුහු මග අසල නැවතුනහ. නාතු ඔවුන් දෙදෙනාට තනිවන්නට ඉඩ දී වෙළඹ ද රැගෙන අඩි කිහිපයක් ඉදිරියට ගොස් නැවතුනේය.

එම මොහොතේ මීට සත් වසරක ට පෙර මෙවැනිම දිනයක නිදිගත් මතකයන් මානක් තුල අවදිවන්නට විණි. එබැවින් නාතු පිලිබඳ නොපහන් බවක් මානක් තුල ඇති වන්නට වූයේය. මෙවැනි ම දිනක මානක් සිය මිතුරන් හා චම්බාවෙහි සැණකෙළියට යමින් උන්නේය . මානක්ට ප්‍රථම වරට ගුලරි මුණගැහුනේ එහි දීය. එහිදී ඔවුහු එකිනෙකා ගේ හදවත් හුවමාරු කර ගත්හ. ඉඩ ලද සෑම මොහොතකම ගුලරි හා මානක් හුදෙකලාව හමු වන්නට වූහ.

"ඔයා හරියට කිරි වැදුණු ගොයමක් වගේ ගුලරි" ඇගේ අත ගනිමින් මානක් පැවසූ අයුරු ඔහුට සිහිපත් විණි.

"හරක් ඇදෙන්නෙ කිරි වැදුණු ගොයමට තමයි..... ඒත් මිනිස්සු කැමති වී සහල් කරල බත් කන්න. ඔයා මට කැමතිනම් ඇයි අපේ තාත්තව මුණගැහෙන්න නැත්තෙ?" ඕ මානක් වෙතින් සියත මුදා ගනිමින් පැවසුවාය.

විවාහෝත්සවයට පලමුව දෑවැද්ද තීන්දු කිරීම මානක් ගේ නෑදෑයන් අතර සිරිතක් වශයෙන් කෙරිණ. දෑවැදි පිණිස කොපමණ වටිනාකමක් ගුලරි ගේ පියා විසින් නියම කරාවිදැයි මානක් පසුවූයේ බියෙනි. එහෙත් ගුලරිගේ පියා කලක් නගරයේ ජීවත් වූ පුද්ගලයකු වූ අතර මුදල් හදල් හා වත් පොහොසත් කම වලින් ඔහුට හිඟයක් නොතිබිණි. ගුලරිට හැම අතින්ම යහපත් ස්වාමියකු ලැබෙන්නේ නම් දෑවැදි නො ඉල්ලන බවට ඔහු දිවුරා තිබිණි. "මානක්", ඔහු තීරණය කළේය. සියලු අවශ්‍යතා පූරණය කිරීමෙන් අනතුරුව මානක් හා ගුලරි එකම කැදැල්ලකට වූහ.

කෙටි කතාව

"මොනව ගැනද අප්පෙ ඔයතරමට හීන දකින්නෙ?" ඕ විහිළු කලාය.

මානක් කිසිත් නොදෙඩීය. ඇතින් ඇසුණේ වෙළඹගේ නො ඉවසිලිමත් හේමාරවයයි. එසැනින් ගුලරි යන්නට නැගීසිටියාය.

"මෙතන ඉඳල හැතැප්ම දෙකක් විතර එනායින් තියෙනවයි කියන කැලේ ඔයා දන්නවද ? මිනිස්සු කියනව ඒ කැලේ මැද්දෙන් යන ඕනෙම කෙනෙක් බිරි වෙනව කියල....හරියටම ඔයත් දැං ඒ කලෙ මැද්දෙන් ගිහින් ආවා වගේ....මං කියන කිසිම දෙයක් ඇහෙන්නෙ නැති හැටි" ගුලරි කීවාය.

"ඔයා හරි ගුලරී....ඔයා කියන කිසිම දෙයක් මට ඇහෙන්නෙ නැහැ තමා". මානක් හීල්ලුවේය.

ඔවුහු මොහොතකට එකිනෙකා දෙස බලා ගත් වනම හුන්නෝය. එහෙත් මානක් ට හෝ ගුලරිට එකිනෙකාගේ හැඟුම් තේරුම් ගත නොහැකි විය.

"මම දැන් යන්න ඕනෙ...ඔයා ආපහු ගියොත් හොඳයි දැන්....ගෙදර ඉඳලා සෑහෙන දුරක් ආව නේ" මානක් අමතා ඕ මුදු ලෙස කීවාය.

" පයින්ම ආවනෙ ගොඩක් දුර ...දැන් අස්සයගෙ පිටට නැග්ගොත් හොඳයි නේද" මානක් පිලිතුරු දුන්නේය.

"ආ, ඔයාගේ බට නළාව"

"තියාගන්න"

"සැණකෙළිය දවසෙ ඇවිත් මේක පිඹිනව නේද?". දෙතොල මත රැඳුනු මුදු මඳ හසින් යුතුව ඕ නැවතත් විමසා සිටියාය. ඇගේ දෙනෙත සූර්ය කාන්තියෙන් බැබලිණි. මානක් ඉවත බලා ගත්තේය. සොවින් දෙවුර හැකුළ ගුලරි චම්බාව වෙත පිටත්ව ගියාය.

මානක් ආපසු හැරුණි.

නිවසට ගොඩ වැදුනු මානක් කිසිදු උද්යෝග කින් තොරව ඇඳමතට ඇද වැටුණේය.

"මෙච්චර වෙලා කොයි දීපංකරේක හිටියද .... චම්බාවටම ගියාද ඇරලන්න" මව ගෝරනාඩු කළාය.

" ගොඩක් දුර නෙමෙයි...කන්ද උඩට විතරයි" මානක් ගේ හඬ බර වී තිබිණ.

"නාකි ගැනියෙක් වගෙ බැඟිරි තලන්නෙ මොකද....මිනිහෙක් වෙයන්" මව බැන වැදුනාය.

" අම්මත් ගැනියෙක් නේද....නිකමටවත් තෙතමනයක් නැද්ද ඔය හිතේ හැබෑටම" යයි පෙරළා අසන්නට මානක් ට සිතුනද ඔහු නිහඬ විය.

මානක් සහ ගුලරි විවාපත් ව සත් වසරක් ගෙවී ගියද ඔවුනට දරුවන් නොවීය. අට වෙනි වසරටත් එයම සිදුවනු දැකීමට අකමැති වූ මානක්ගේ මව ඒ සඳහා රහසිගතව උපායක් යෙදුවාය. එනම්, මේ වසරේ සැණකෙළිය සඳහා ගුලරි නිවසින් පිටව ගිය කල මානක් වෙනුවෙන් දෙවන බිරියක කැඳවා ගෙන ඒමය. ඇය ඒ සඳහා රුපියල් පන්සීයක මුදලක් ගෙවා ඇති බව මානක්ද දැනසිටියේය. මවටත් සිරිතටත් ගරු කල මානක්ගෙ සිරුර අලුතින් කැඳවාගෙන ආ ගැහැණිය වෙනුවෙන් ප්‍රතිචාර දක්වුවද හදවත ඔහු තුලම මියැදී තිබිණ.

එක් උදෑසනක මානක් මැටි පයිප්පයෙන් දුම් උරමින් සිටිනා අතරතුර ඔහුගේ පැරණි

33 වන පිටුවට